දේශීය වෙදකම

# ආසියානු වෙදකමට බැල්ම හෙළන බටහිර බලවත්තු

මැලේරියාව නම් වසංගතයට මෙතෙක් ලබා දුන් එකම ප්‍රතිකාරය වූයේ කුයිනින් නැමැති ඖෂධය පමණකි. දකුණු ඇමරිකානු ශාකයකින් ලබා ගත් මෙම ඖෂධය වසර ගණනාවක් තිස්සේ මදුරුවන්ට හුරුවිය. කුයිනික්වල මදුරු නාශක ශක්තිය හීන වූ අතර ඒ වෙනුවට චීනය සතුව මැලේරියාවට පැහැදිලි පිළිතුරක් තිබුණේ ය.



**ලෝකයම ආක්‍රමණය කරමින් බටහිර රටවල් තම අධිපතිත්වයේ දෑත් දසතම විහිදුවමින් සිටියි. නමුත් ඔවුනගේ ඇඟිලි තුඩු වලට හසු නොවුණු විශ්වකර්ම තාක්ෂණයක් ආසියාව තුළ රැඳී ඇත. මෙම විශ්වකර්ම තාක්ෂණවේදය සොරකම් කිරීමට, බලයෙන් උදුරා ගැනීමට බටහිර රටවල බලවත්තු කාලයක සිට උත්සාහ කරමින් සිටියි. මෙසේ තම බලයෙන් ඩැහැ ගැනීමට නොහැකි වූ විට යාප්පුවෙන් ගැනීමට බලවත්තු උත්සාහ දරයි. ආසියාව පුරාම ව්‍යාප්ත වී ඇති බටහිර රටවලට තේරුම් ගැනීමට අපහසු වී ඇති ආසියානු වෙදකම එවැන්නකි.**

චීනය, ඉන්දියාව, ශ්‍රී ලංකාව, ඉන්දුනීසියාව ප්‍රමුඛව ආසියාවේ ව්‍යාප්තව ඇති වෙදකම සම්ප්‍රදයික අගයෙන් අනූන ය. බටහිර වෛද්‍යවරුන් ස්කෑනර් යන්ත්‍ර, ඊ.ඊ.ජී. ඊ.සී.ජී ආදී මෙකී නොකී යන්ත්‍ර උපයෝගී කරගෙන සොයා ගන්නා රෝගී තත්ත්වය රෝගියාගේ නාඩි බලා, ඇස් දෙස බලා, පිටි අල්ල බලා හෝ රෝග ලක්ෂණය දෙස බලා කීමට ආසියාවේ පාරම්පරික වෛද්‍යවරුන්ට හැකි ය. රෝගීන් එසේ පරීක්ෂා කර බලා ඔහු ලබා දෙනු ලබන ඖෂධවල ගුණය ආසියාතිකයින්ට අමුතුවෙන් හඳුන්වා දීමට අවශ්‍ය නැත. නමුත් ආසියාව සතු මෙම බලය අවාසනාවකට මෙන් ආසියාතිකයින්ට තේරුම් ගැනීමට නොහැකි වී ඇත.

කලක් යුද හමුදවේ භටයෙකු ලෙස සිටි කාම්බෝජයේ සොත්සරු එරට මැණික් පතල් කර්මාන්තයට යොමු විය. ඔහුට මැලේරියාව වැළඳුනේ එසේ පතල් කැනීම් කටයුතුවලදී ය. ආර්ථික අපහසුතා නිසා බටහිර ප්‍රතිකාර ලබා ගැනීමට ඔහුට නොහැකි විය. මුත්‍රා සමග ලේ පිට වී සොත්සරුන් සිහිය නැතිව ඇද වැටුණු පසුව ඔහුව පරීක්ෂා කළ වෛද්‍යවරුන් පැවසුවේ රෝගී වෛරස ඔහුගේ මොළය දක්වා පැතිර ඇති බව ය. මෙහිදී වෛද්‍යවරුන් ඔහුට ආර්ටෙමිස්යා නම් ශාකයෙන් ලබා ගත් කසාය ලබා දුන් අතර සති කිහිපයක් ඇවෑමෙන් ඔහු නිට්ටාවට ම සුවය ලැබීය.

මැලේරියාව නම් වසංගතයට මෙතෙක් ලබා දුන් එකම ප්‍රතිකාරය වූයේ කුයිනින් නැමැති ඖෂධය පමණකි. දකුණු ඇමරිකානු ශාකයකින් ලබා ගත් මෙම ඖෂධය වසර ගණනාවක් තිස්සේ මදුරුවන්ට හුරුවිය. කුයිනින්වල මදුරු නාශක ශක්තිය හීන වූ අතර ඒ වෙනුවට චීනය සතුව මැලේරියාවට පැහැදිලි පිළිතුරක් තිබුණේ ය. ඒ ආර්ටෙමිනිසින් නම් ඖෂධය ය. මැලේරියාව සඳහා අතීතයේ සිට චීන වැසියන් මෙම ඖෂධය භාවිතා කළ අතර 1979 දී වියට්නාමය සමග චීනය අතර පැවැති යුද්ධයේදී චීන රජය තම හමුද භටයින්ට ආර්ටෙමිනිසින් ශාකයෙන් ලබා ගත් ඖෂධ ලබා දුන්නේ ය. එහිදී චීනය ලබා ගත් ප්‍රතිඵලය ඉතාමත් සාර්ථක විය. නූතන ලෝකයේ එම ශාකයෙන් බිහිවන ඖෂධය ලොව හොඳම මැලේරියා මර්ධක ඖෂධයකි. ලෝක සෞඛ්‍ය සංවිධානය(WHO) වසර පහක් තිස්සේ කරන ලද ප්‍රමාද කිරීම් වලින් පසුව චීනය නිෂ්පාදනය කරන මෙම ඖෂධයට අවසර ලබාදී තිබේ. මේ වන විට අප්‍රිකා මහාද්වීපය පුරාම මැලේරියාවෙන් පීඩා විඳිමින් මිය යන මිලියන දෙකකට වැඩි බාල, තරුණ, මහලු පිරිසක් බේරා ගැනීමට මෙම මහඟු චීන ඖෂධයට හැකිවනු ඇතැයි ලෝක සෞඛ්‍ය සංවිධානයේ බලධාරීන් විශ්වාසය පළ කර ඇත.

මැලේරියාව ගුණදයී ආර්ටෙමිසිනින් ඖෂධය ආසියාව ලෝකයට දයාද කළ එක් මහඟු ඖෂධයක් වන අතර ඔවුන් සතුව එවැනිම ගුණදයී තවත් බොහෝ ඖෂධ සැඟව තිබේ. ආසියාතික රටවල පැතිර සිටින වෙදමහත්වරු ලෙහෙසියෙන් තම රහස් හෙළි නොකරන පිරිසක් වන අතර බටහිර රටවල විද්‍යාඥයින් මෙම ඖෂධවල රහස් පිස්සුවෙන් මෙන් සොයන්නට උත්සාහ ගනියි.

නැගෙනහිර ආසියාතික රටවල බොහෝ පාලකයින් ඔවුන්ගේ රටවල දේශීය ඖෂධ සඳහා වටිනාකමක් ලබාදීමට උත්සාහයක යෙදී සිටින අතර ඒ සමගම ආසියාවේ පැතිර පවත්නා රහස් ඖෂධවල තත්ත්වය විද්‍යාත්මකව තහවුරු කර ඒ හරහා ආසියාවේ ඖෂධවලට ලොව පිළිගැනීමක් ලබා

ගැනීමට උත්සාහයක යෙදී සිටියි. චීනය, හොංකොන්, තායිවානය, ඉන්දුනීසියාව හා සිංගප්පූරුව මෙම රටවල් අතරින් ඉදිරියෙන් ම සිටින අතර 2006 දී තම රට "චීන ඖෂධ තාක්ෂණයේ දූපත" කිරීමට තායිවානය උත්සාහයක නිරතව සිටියි. පසුගිය 2001 වසරේදී ඇමරිකාවේ ඖෂධ වෙළෙඳ-පොළේ විකුණන ආසියාතික ඖෂධවල වටිනාකම ඩොලර් බිලියන 40 ක් වූ අතර එම ප්‍රමා-ණය 2002 දී ඩොලර් බිලියන 50 ඉක්මවා යෑමට අදහස් කරයි.

තත්ත්වය මෙසේ වුවද ආසියා-තික රටවල දේශීය ඖෂධ ලෝක වෙළෙඳ පොළේ ස්ථාවර වීමට නොහැකි කරුණක් වන්නේ එම ඖෂධවල අඩංගු සංයෝග ප්‍රමා-ණය නිසා ය. මෙම ඖෂධවල අඩංගු බෙහෙත් ද්‍රව්‍ය ඉතා සංකීර්ණ ය. එසේම බටහිර ඖෂධ මෙන් එක් රෝගයකට සරිලන එක ඖෂධයක් ආසියාතික කිසිම ඔසුවක නැත. ඇත්තේ ඖෂධ සංයෝගයකි. නමුත් ප්‍රශ්-නය වී ඇත්තේ ලෝකයේ ඖෂධ අණ පනත් සකස් වී ඇත්තේ සංයෝග සඳහා නොවීම ය. මේ නිසා ඇමරිකාව හා යුරෝපීය වැනි රටවල ඉල්ලුමක් ඇති ආසියානු ඖෂධය සඳහා වෙළෙඳපොළ තරණය කිරීමට එය බාධාවක් වී ඇත.

එසේම ආසියානු රටවල ඖෂ-ධවල ස්වභාවය හා ක්‍රියාකා-රිත්වය හඳුනා ගැනීමට බටහිර විද්‍යාඥයින්ට නොහැකිවීමත් මෙය හේතු වී ඇත. දැනට භාවිතා වන කටු චිකිත්සාව තුළින් රෝග නිට්-ටාවට සුව වන බව බටහිර පිළි-ගත්තත් එම ක්‍රියාවලිය සිදුවන්නේ කෙසේද යන්න තේරුම් ගැනීමට තවමත් අපොහොසත් වී ඇත. එය විග්‍රහයට ලක් කිරීමට ආසියානු වෙදකමේ කොටසක් නොමැති කමින් මේ නොදන්නා වෙදකමට යෑමට බටහිර රටවල් දක්වන්නේ දැඩි බියකි. ශාක ඖෂධ අලෙවිය පිළිබඳ නමක් දිනා ඇති එස්.කේ. කෙමිකල්ස් සමාගමේ අලෙවි විධායක රියුබුසුන්ග් පවතින මෙම තත්ත්වය දකින්නේ බටහිර වෙද-කමේදී වෙදකම් කරනු ලබන්නේ

**දැනට භාවිතා වන කටු චිකිත්සාව තුළින් රෝග නිට්ටාවට සුව වන බව බටහිර පිළිගත්තත් එම ක්‍රියාවලිය සිදු-වන්නේ කෙසේද යන්න තේරුම් ගැනීමට තව-මත් අපොහොසත් වී ඇත. එය විග්‍රහයට ලක් කිරීමට ආසියානු වෙදකමේ කොටසක් නොමැති කමින් මේ නොදන්නා වෙදකමට යෑමට බටහිර රටවල් දක්වන්නේ දැඩි බියකි.**

රෝගයට යි. නමුත් සම්ප්‍රදායික ආසියාතික වෛද්‍ය ක්‍රමයේදී රෝගය ඉලක්ක කර ගෙන වෙද-කම් කරන්නේ නැහැ. ඒ වෙනුවට මුළු ශරීරයම සමබර කිරීමට ගන්නා වූ උත්සහයක් තියෙන්නේ..." යනුවෙනි.

1995 දී පමණ රියු කොරියානු වෙදකම අනුග්‍රහයෙන් ආතරයිටිස් රෝගය සඳහා ලොවට ඖෂධයක් හඳුන්වා දුන්හ. වයස 60 වැඩි පුද්-ගලයින්ගෙන් 10% ක් පමණ පීඩා විඳින මෙම රෝගී තත්ත්වයට බටහිර වෙදකමේදී සම්පූර්-ණයෙන් සුව කිරීමට ඖෂධ නොමැතිකමට හේතුවක් වී ඇත්තේ ඔවුන් නිවැරදිව එම රෝගී තත්ත්වය හඳුනා නොගැනීම ය. නමුත් සම්ප්‍රදායික දේශීය වෙද-කමේදී සුළඟ, සීතල හා තෙතම-නය යන කරුණු තුන වියළි බව සමග සමතුලිත නොවීම නිසා මෙම රෝගය ඇතිවන බව පිළිග-නියි. සම්ප්‍රදායික ආසියාතික වෙද-කමේදී කරනු ලබන්නේ මෙම කරුණු තුන සමතුලිත කිරීම ය. රියු කොරියානු වෙදකමේ ආතර-යිටිස් රෝගයට ඇති ඖෂධ සංයෝග එකතු කර කහ පැහැති පෙත්තක් වෙළෙඳ පොළට නිකුත් කර ඇත. එය මෙතෙක් ආතර-යිටිස් රෝගය සඳහා හොඳම ඖෂධය ලෙස පිළිගැනෙන වොල්-ටර් රොත් ඖෂධයට වඩා අතුරු ආබාධ අවම ඖෂධයක් ලෙස පිළිගැනේ. මෙම යහපත් ලක්ෂණ නිසා "ජොයින්ස්" නමින් නම් වූ මෙම ඖෂධය ක්‍රමයෙන් බටහිර ඖෂධ වෙළෙඳපොළ ආක්‍රමණය කිරීමට පටන් ගෙන ඇත.

පිළිකා, කොලෙස්ටරෝල් වැඩි-වීම, ලේ කැටි ගැසීම වැනි රෝගී තත්ත්වයන් සඳහා බටහිර ඖෂධ ලෙස බොහෝ විට දෙනු ලබන්නේ පොලිසිනෝල් හා සැපොනින්ස් වැනි ඖෂධ සංයෝගය ය. නමුත් ඔවුනගේ මෙම ඖෂධවලට වඩා සාර්ථක ප්‍රතිඵල චීන වෛද්‍යව-රුන් ලබා සිටියි. මේ පිළිබඳව කුන්මියන් පර්යේෂණ ආයතනයේ පර්යේෂක පර්යේලුයි ජිකායි සඳ-හන් කරන්නේ "බටහිර වෛද්‍ය ක්‍රමය තවමත් යන්නේ අඟුලට හරියන යතුර සොයා ගැනීමට යි. දැනටමත් චීනය සම්ප්‍රදායික වෙද-කමේදී කරනු ලබන්නේ විවිධ රෝගී තත්ත්ව වලට එකවර ප්‍රති-කාර කිරීම යි. විශේෂයෙන් නිදන්-ගත රෝග ඇතිවන්නේ හේතු කීපයක් ම බද්ධවීම නිසයි. අපේ සම්ප්‍රදායික වෙදකමේදී මේ සෑම හේතුවකටම වෙදකම් කරනු ලබ-නවා. මෙන්න මේ හේතුව නිසයි සම්ප්‍රදායික වෙදකමට නිදන්ගත රෝග කඩන්න හැකි වෙලා තියෙන්නේ...."

**මීට වසර 2200 දී තරම් ඈතකදී චීනය සොයා-ගත් මෙම විශ්වකර්ම ඖෂධය නිසා අද බටහිර රටවල ආසි-යානු ඖෂධ පිළිබඳ මහා පිබිදීමක් ඇති කිරීමට සමත්ව සිටියි. බලයෙන් ගැනීමට බැරි ආසියාව සතු මෙම වෙදකම් පිළිබඳ රහස් බටහිර රටවල් යාප්පු-වෙන් ගැනීමට දැන් උත්සාහ කරයි.**

ඉතාමත් මෑතකදී වොෂින්ටන් විශ්ව විද්‍යාලයේ ජීව ඉංජිනේරු විද්‍යාව පිළිබඳ මහාචාර්ය හෙනව්රි පාට් චීන ඖෂධයක් වූ ආර්ටෙමිසිනින් පිළිබඳ සුවිශේෂී සොයා ගැනීමක් කර ඇත. මෙම පර්යේෂණ අනුව පිළිකා සෛල විනාශ කිරීමේ සුවිශේෂ හැකියා-වක් ආර්ටෙමිනිසින් වලට ඇතැයි සොයා ගැණුනි. මෙම ආසියාතික ඖෂධයට නිරාවරණය වූ පියවුරු පිළිකා සෛල පැය 16 ක් තුළදී විනාශයට පත්වී ඇති අතර එහිදී අනෙකුත් සෛලවලට හානියක් නොවන බව පෙනුණි. ජර්මනිය හා ඇමරිකාව ඒකාබද්ධව මෙම ඖෂධය සම්බන්ධව කරන ලද ප්‍රතිඵල අනුව ආර්ටෙමිනිසින් ලියුකේමියා හා අස්ථි පිළිකාවල ආරම්භක අවස්ථාවලදී ඉතා සාර්-ථක ඖෂධයක් ලෙස සොයා ගෙන ඇත. එපමණක් නොව මෙම ආර්-ටෙමිනිසින් ඖෂධ මැලේරියාව සම්බන්ධයෙන් කෙරුණු පර්යේ-ෂවලදී මැලේරියා පරපෝෂිතයා සමග ප්‍රතික්‍රියා කරන බව තහවුරු කර ගෙන ඇත.

මීට වසර 2200 දී තරම් ඈත-කදී චීනය සොයාගත් මෙම විශ්ව-කර්ම ඖෂධය නිසා අද බටහිර රටවල ආසියානු ඖෂධ පිළිබඳ මහා පිබිදීමක් ඇති කිරීමට සමත්ව සිටියි. බලයෙන් ගැනීමට බැරි ආසියාව සතු මෙම වෙදකම් පිළිබඳ රහස් බටහිර රටවල් යාප්පුවෙන් ගැනීමට දැන් උත්සාහ කරයි. සාමාන්‍යයෙන් රහස් ලබා ගැනීමෙන් පසුව සියලුම මූලාශ්‍ර විනාශ කර එය තමන්ගේ සොයා ගැනීමක් ලෙස නිෂ්පාදනය කර ගැනීමට උත්සාහ දැරීම බටහිර රටවල සිරිත ය. එබැවින් ශ්‍රී ලංකාව පුරා පැතිර ඇති දේශීය වෙදකම බටහිරට අත්කර නොදීම අපගේ යුතුකම විය යුතු ය. ❑

Time ඇසුරිනි
**ක්‍රිස්ටි මහේෂ් ද සිල්වා**